REFERENCE ONLY

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

2016 . 07 . 14

## පෙරදිග සංගීතය

9 ශ්‍රේණිය

විභාග අංකය : ....................................

කාලය පැය 02 යි

### I කොටස

★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

★ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. එක් ස්වරයක් පමණක් විකෘති ව යෙදෙන රාගය වනුයේ,
(1) බිලාවල් රාගය ය. (2) කාෆි රාගය ය. (3) යමන් රාගය ය. (4) භූපාලි රාගය ය.

02. නිර්දේශිත තාල අතරින් සමග්‍රහය සහ බලිය පමණක් යෙදෙන තාල යුගලය වන්නේ,
(1) දාදරා සහ කෙහෙර්වා ය. (2) දාදරා සහ ත්‍රිතාලය ය.
(3) ජප් තාලය සහ කෙහෙර්වා ය. (3) ජප් තාලය සහ ත්‍රිතාලය ය.

03. "ධ , ග" සහ "ග , ධ" යන ස්වර වාදී සහ සංවාදී ස්වර ලෙස යෙදෙන රාග යුගලය වන්නේ පිළිවෙළින්,
(1) බිලාවල් සහ කාෆි වේ. (2) බිලාවල් සහ භූපාලි වේ.
(3) කාෆි සහ යමන් වේ. (4) භූපාලි සහ කාෆි වේ.

04. දීප්චන්දි තාලයේ ඨේකාව දෙවරක් වැයූ විට ලැබෙන්නේ,
(1) මාත්‍රා 14 කි. (2) මාත්‍රා 20 කි. (3) මාත්‍රා 27 කි. (4) මාත්‍රා 28 කි.

05. භක්තිය දනවන භාරතීය සරල ශාස්ත්‍රීය ගායනා ශෛලියක් ලෙස සැලකෙන්නේ,
(1) කව්වාලි ය. (2) ගසල් ය. (3) භජන් ය. (4) ඛ්‍යාල් ය.

06. සුළු මැදුම් දෙතිතට අනුව මාත්‍රා කැටි වන්නේ,
(1) 1 2 / 1 2 3 ලෙසිනි. (2) 1 2 3 / 1 2 3 ලෙසිනි.
(3) 1 2 3 / 1 2 3 4 ලෙසිනි. (4) 1 2 3 4 / 1 2 3 4 ලෙසිනි.

07. හේවිසි වාදනය සඳහා අත්‍යවශ්‍ය විතතාතත වර්ගයට අයත් භාණ්ඩය වන්නේ,
(1) ගැටබෙරය යි. (2) දවුල යි. (3) බුම්මැඩිය යි. (4) තම්මැට්ටම යි.

08. සරල ගීත නිර්මාණයේදී දේශීය ජන සංගීතයේ ආභාසය ලබා ඇත. පහත සඳහන් ගී අතරින් එලෙස නිර්මාණය වූ ගීතයක් වන්නේ,
(1) ඉපල් පිටින් ගහන අව්ව ගීතයයි. (2) මල්සරා බැල්ම හෙලා ගීතයයි.
(3) රත්නදීප ජන්ම භූමි ගීතයයි. (4) රන් මලක් ලෙස ගීතයයි.

09. මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් ශුද්ධ ස්වර සප්තකය ලියා දක්වීමේදී ලැබෙන විකෘති ස්වර පිළිවෙළින්,
(1) ග සහ නි වේ. (2) ම් සහ ධ වේ. (3) නි සහ ම් වේ. (4) රි සහ නි වේ.

10. බටහිර සංගීතයේ දී භාවිත වන හඬ තල 4 පිළිවෙළින්,
(1) සොප්‍රානෝ, ඇල්ටො, ටෙනර්, බේස් වේ. (2) ඇල්ටො, ටෙනර්, සොප්‍රානෝ, බේස් වේ.
(3) බේස්, ටෙනර්, ඇල්ටො, සොප්‍රානෝ වේ. (4) ටෙනර්, ඇල්ටො, සොප්‍රානෝ, බේස් වේ.

11. ප්‍රසංග වේදිකාවේ තාල වාදනය සඳහා බහුලව භාවිත වන විද්‍යුත් සංගීත භාණ්ඩයක් වන්නේ,
(1) තබ්ලාව යි. (2) ඩොල්කිය යි. (3) ගිටාරය යි. (4) ඔක්ටපෑඩය යි.

12. විනෝදාස්වාදය හා විවිධ මිනිස් අවශ්‍යතා මත නිර්මාණය වූ ගී හැඳින්වෙන්නේ,
(1) ඇදහිලි ගී ලෙස ය. (2) සමාජයීය ගී ලෙස ය. (4) කෙළි ගී ලෙස ය. (4) බැති ගී ලෙස ය.

13. සුනිල් සාන්තයින් විසින් ගායනා කරන ලද දේශාභිමානී ගීතයක් වන්නේ,
(1) මේ සිංහල අපගෙ රටයි ගීතය යි. (2) රණ බිම මැරුණේ සිංහලයෙකු නම් ගීතය යි.
(3) ලංකා ලංකා පෙම්බර ලංකා ගීතය යි. (4) මගේ රටට දළඳා හිමි සරණයි ගීතය යි.

14. පහත රට බෙරය සඳහා භාවිත <u>නොවන</u> නාමයකි,
(1) යක් බෙරය. (2) දෙවොල් බෙරය. (3) මගුල් බෙරය. (4) සොෂක බෙරය.

15. දොහොරාව නම් ගායන අංගය ඇතුළත් හින්දුස්ථානි ගායන ශෛලියක් වන්නේ,
(1) බයිලා ය. (2) භජන් ය. (3) කපිරිඤ්ඤා ය. (4) කව්වාලි ය.

16. සංගීතයේ ස්වර දොළස ශුද්ධ, කෝමල, තීව්‍ර වශයෙන් වර්ග කළවිට ලැබෙන සංඛ්‍යා පිළිවෙළින්
(1) 4, 6, 2 වේ. (2) 7, 4, 1 වේ. (3) 8, 5, 1 වේ. (4) 5, 5, 2 වේ.

★ පහත සඳහන් A, B, C අක්ෂරවලට අයත් ගී පාද ඇසුරින් ප්‍රශ්න අංක 17 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - උදයට පායන හිරු දෙවියන්ටයි.

B - තෙල් ගාලා හිස පීරන් නැනෝ.

C - ඉහළ වෙළේ තියෙන බැතා.

17. පිරිමින් පමණක් සහභාගි වී ඉටු කරන සුවිශේෂී කාර්යයක් සඳහා භාවිත කරනු ලබන ගීතය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) A හා B ය.

18. ගැමි කාන්තාවන් ප්‍රධාන කොට ඉටු කරනු ලබන කාර්යයක් සඳහා භාවිත කරන ගීතය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) B හා C ය.

19. ගැහැණු, පිරිමි සාමූහික ලෙස සහභාගි වී කරන කාර්යය හා සම්බන්ධ ගීතය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) A, B, C ය.

20. A, B, C යන කොටස් 3 ටම ඇතුළත් ගී අයත් වන්නේ,
(1) අනාසාකාත්මක ගී ගණයට ය. (2) ඇදහිලි ගී ගණයට ය.
(3) සෙ ගී ගණයට ය. (4) මෙහෙ ගී ගණයට ය.

(ලකුණු 20)

## II කොටස

★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. (1) භීමපලාසි හෝ යමන් යන රාග අතරින් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි කොටස නියමිත තාල සංඥා සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
(2) ඔබ තෝරා ගත් රාගයට අදාළව මාත්‍රා අටේ තානාලංකාර 2 ක් ලියා දක්වන්න.
(3) ඔබ තෝරා නොගත් රාගයේ ආරෝහණය සහ අවරෝහණය නිවැරදිව ලියා දක්වන්න.
(ලකුණු 5 + 3 + 2 = 10 යි)

02. ග - ම | ප - ග | ම - ග | රි - - |
ග - ම | ප - ධ | නි - - | - - - |
(1) ඉහත ස්වර ඛණ්ඩය මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් ප්‍රස්තාර කර දක්වන්න.
(ලකුණු 5 + 5 = 10 යි)

03. (1) විතතාත ගණයට ගැනෙන වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් ඇඳ එහි කොටස් 4 ක් නම් කරන්න.
(2) මෙම වාද්‍ය භාණ්ඩය භාවිතයට ගන්නා අවස්ථා 3 ක් ලියා දක්වන්න.
(3) පහත සඳහන් බෙර පද වාදනය කරන භාණ්ඩ නම් කරන්න.
(අ) දොං / ජිංත / ගත / දොං ත
(ආ) ජෙං කිටි කිටි තක / තත් කිටි කිටි තක
(ඇ) ගුං ගුද ගදි ගත / ගදි ගත ගදි ගත
(ලකුණු 4 + 3 + 3 = 10 යි)

04. (1) "ඇසේ මතුවන කඳුළු බිඳුගෙන" යන ගීතයට වාදනය කළ හැකි හින්දුස්ථානි තාලය නම්කර එය නියමිත තාල සංඥා හා මාත්‍රා සහිතව ප්‍රස්තාර කරන්න.
(2) එම තාලයට ගැලපෙන දේශීය තිත් රූපයට අයත් බෙර පදයක් තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
(3) මාත්‍රා 3 න් 3 ට තාල තැබිය හැකි ගී පාදයක් ප්‍රස්තාර කරන්න.
(ලකුණු 4 + 4 + 2 = 10 යි)

05. (1) දේශාභිමානි ගීතයක් ඇසීමේදී සහ ගායනා කිරීමේදී මතුවන සුවිශේෂී ලක්ෂණ 4 ක් ලියා දක්වන්න.
(2) දේශාභිමානී ගී උපයෝගී කරගන්නා අවස්ථා 3 ක් දක්වන්න.
(4) ඔබ දන්නා දේශාභිමානී ගීත 3 ක් නම් කර ඉන් එක් ගීතයක මුල් කොටසේ පද මාලාව ලියා දක්වන්න.
(ලකුණු 4 + 3 + 3 = 10 යි)